සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 1 1/2 |

නම :- ..................................................................................... විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:

* I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
* II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* I හා II ප්‍රශ්න පත්‍ර සඳහා මුළු ලකුණු 50ක් වන අතර ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50ක් වශයෙන් මුළු ලකුණු 100කි.

## I කොටස

❖ අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) කොප්පර කොප්පර පිපිඤ්ඤා - පස්ස බැලුවොත් දෙසඤ්ඤා.. මෙම කවිය ඇතුලත් ජන ක්‍රීඩාව වන්නේ,

(1) එළුවන් කෑම (2) පනා හැංගීම
(3) ලේන්සු හැංගීම (4) මේවර කෙළිය

(02) ඔබ පාසලේ දී උගත් ජනකතාවක් නොවන්නේ,

(1) පුංචි අපිට දැන් තේරේ (2) බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට
(3) හීල් බත් දංකුඩ (4) නාඩි බැලීම

(03) "අහස කඩා වැටේ" කතන්දරයෙන් ලබාදෙන ආදර්ශය නම්,

(1) පුංචි සිදුවීමකට බිය විය යුතු ය.
(2) අනුන් කියනා දේ ඒ අයුරින් ම පිළිගත යුතු ය.
(3) ඕනෑම දෙයක් පිළිබඳව හොඳින් සොයා බලා තීරණ ගත යුතු ය.
(4) පුංචි සිදුවීම් වලට බිය නොවිය යුතු ය.

(04) අධි මානුෂීය චරිතයක් වන්නේ,

(1) ගමරාළ (2) ගුරුවරයා (3) හෙදිය (4) සුරංගනාවිය

(05) ආනුශංගික අංගයක් නොවන්නේ,

(1) වේදිකා පසුතල (2) සංගීතය (3) රංගාලෝකය (4) නාට්‍ය පෙළ

❖ අංක 06 - 10 දක්වා ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද, වැරදි නම් × ලකුණ ද යොදන්න.

(06) රංගාභරණ ප්‍රමාණයෙන් කුඩා විය යුතු ය. ( )

(07) සෑම කතන්දරයක් ම නාට්‍යයක් සඳහා උචිත වේ. ( )

(08) රංගනයක දි යොදාගන්නා උපකරණ "නාට්‍යෝපකරණ" නම් වේ. ( )

(09) සත්ව චර්යා ඇසුරෙන් ජීවිත පරිඥානය පුළුල් කරගත හැක. ( )

(10) රංගනයේ දි සිරුර සහ මනස අතර සබඳතාවය අත්‍යවශ්‍ය නොවේ. ( )

❖ අංක 11 - 15 දක්වා වගන්තිවලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.
(සංවේදන අභ්‍යාස, අභිරූපණය, සමාජ විවිධත්වය, ශ්වසන අභ්‍යාස, පරිකල්පනය, සිරිත්මල්දම, අනුකරණය, ක්ෂණික නිරූපණය, ජනකථා යුගය, ජනකවි)

(11) පෙර සූදානමකින් තොරව කරන නිරූපණය ............................................... නම් වේ.

(12) නිර්මාණකරණය සඳහා .................................................................... අවශ්‍ය වේ.

(13) මිනිස් ජීවිතය යහමඟට යොමුකරන ග්‍රන්ථයක් ලෙස ............................................... හඳුන්වා දිය හැකි ය.

(14) විවිධ ජනකොටස්වලට අයත් ජනකතා ඇසුරෙන් ....................................................... හඳුනාගත හැකි ය.

(15) හඬ පාලනය කරගැනීම සඳහා .......................................................වල නිරත වීම වැදගත් වේ.

❖ අංක 16 - 20 දක්වා "අ" කොටසට අයත් භාණ්ඩයට ගැළපෙන සම්බන්ධතාව "ආ" කොටසේ ඇත. එය තෝරාගෙන එකිනෙක යා කොට දක්වන්න.

| | "අ" කොටස | "ආ" කොටස |
|---|---|---|
| (16) | කෝදුව | හැරමිටිය |
| (17) | සිසු මේස කිහිපයත් | කඩුව |
| (18) | පෑන | සිංහාසනය |
| (19) | කොස්ස | ඇඳ |
| (20) | ගුරු පුටුව | බටනලාව |

(ලකුණු 1 x 20 = 20

## II කොටස

*** පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.**

(01) (i) අභිනය යනු කුමක් ද? (ලකුණු 02)

(ii) අභිනය කොටස් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඔබ නැරඹූ නාට්‍යයක සතර අභිනය යොදාගෙන ඇති ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)

(02) (i) භූමිකාව යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ඔබ කැමැති ඕනෑම චරිතයක භූමිකා 04ක් ලියන්න. (ලකුණු 04)

(iii) ඉන් එක් භූමිකාවකට උචිත දෙබස් කාණ්ඩ 04ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(03) (i) කතන්දර වර්ග හතර නම් කරන්න. (ලකුණු 02)

(ii) කතන්දර හා නාට්‍ය අතර වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) කතන්දර ඇසුරෙන් බිහිවූ නාට්‍ය දෙකක නම් ලියන්න. (ලකුණු 04)

(04) (i) "පුංචි අපට දැන් තේරේ" නාට්‍ය රචනා කළේ කවු ද? (ලකුණු 02)

(ii) එම නාට්‍යයේ එන චරිත හරතක් නම් කර එම චරිතවල චරිත ලක්ෂණ ලියන්න. (ලකුණු 04)

(iii) එම නාට්‍යයෙන් ගත හැකි ආදර්ශය කුමක් ද? (ලකුණු 04)

(05) ඔබ පාසලේ දී උගත් "තොප්පි වෙළෙන්දාගේ කතන්දරය" ඔබ කැමැති ආකාරයට රසවත්ව වෙනස් කරමින් කතන්දරයක් ලෙසම රචනා කරන්න. (ලකුණු 10)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: ප්‍රායෝගික පරීක්ෂණය

(01) නාට්‍ය ගීතයක් හෝ ළමා ගීතයක් ගායනා කරමින් රංගනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

(02) එකම වචනය අර්ථ තුනකින් උච්චාරණය කරන්න.
(1) අම්මේ (2) මට බෑ (3) දෙයියනේ
(4) ලස්සනයි (5) හරි පුදුමයි (ලකුණු 15)

(03) පහත දැක්වෙන චරිත අතුරෙන් කැමති චරිතයක් තෝරා ක්ෂණික නිරූපණයක් කරන්න.
(1) බස් කොන්දොස්තර
(2) යාචකයා
(3) ඡන්ද අපේක්ෂකයා
(4) හාමුදුරුවෝ
(5) උමතු රෝගියා (ලකුණු 10)

(04) පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් තෝරා එක් කණ්ඩායමකට සිසුන් 3 - 5 සිටින සේ සාමූහිකව ක්ෂණික නිරූපණයක් කරන්න.
(1) වෙළඳපොල
(2) මඟුල් ගෙය
(3) බස් නැවතුම් පොළ
(4) මළගෙය
(4) දන්ත වෛද්‍ය මධ්‍යස්ථානය (ලකුණු 15)